# රුධිර ජනක සෛල ප්‍රදානය කිරීම

## රුධිර ජනක සෛල ප්‍රදානය කිරීම යනු කුමක් ද?

මිනිස් සිරුරේ සියලු රුධිර සෛල නිපදවන්නේ රුධිර ජනක සෛල මඟිනි. මේවා ඇත්තේ රතු ඇට මිදුළු තුළ යි. රුධිර සෛල නිපදවීමේ අසාමාන්‍යතා සහ ඇතැම් රුධිර පිළිකා තත්ත්වයන්හි දී ඇටමිදුළු බද්ධය නමැති ප්‍රතිකාර ක්‍රමයට මෙම රුධිර ජනක සෛල අවශ්‍ය වේ.

## රුධිර ජනක සෛල ප්‍රදානය කිරීම යනු කුමක් ද?

රුධිර පිළිකා සහ තැලසීමියාව වැනි ඇතැම් රෝග තත්ත්ව සඳහා සුදුසු ම ප්‍රතිකාර ක්‍රමය වන්නේ රුධිර ජනක සෛල බද්ධ කිරීම යි. මෙම රෝග සඳහා ඇති වෙනත් ප්‍රතිකාර ක්‍රම මඟින් බොහෝ විට එම රෝග ස්ථිර වශයෙන් සුව නොවේ.

## මේ සඳහා සුදුසු වන්නේ කවරෙක් ද?

වයස අවුරුදු 18 - 45 අතර නිරෝගී ඔබ රුධිර ජනක සෛල පරිත්‍යාගය සඳහා සුදුසු ය.

## රුධිර ජනක සෛල ප්‍රදානය කිරීමට ඔබ කළ යුත්තේ කුමක් ද?

මේ සඳහා වැඩි විස්තර සඳහන් තොරතුරු පත්‍රිකාව සහ ප්‍රතිඥා පත්‍රය කාර්ය මණ්ඩලයෙන් ලබා ගෙන ප්‍රතිඥා පත්‍රය පුරවා වෛද්‍යවරයා වෙත භාර දෙන්න.

## රුධිර ජනක සෛල ප්‍රදානය කිරීමට පෙර සිදු කරන පරීක්ෂණ මොනවා ද?

අනිවාර්යයෙන් ම පටක පරීක්ෂණයක් සිදු කළ යුතු යි. මේ සඳහා ඔබ ගෙන් රුධිර/මුඛයේ පටක සාම්පලයක් ලබා ගනු ඇත.

ඔබ ගේ පටක පරීක්ෂණ ප්‍රතිඵල දත්ත පද්ධතියකට ඇතුළත් කරනු ලබයි. එය සමඟ ගැළපෙන රෝගියකුට රුධිර ජනක සෛල අවශ්‍ය වුවහොත් රුධිර ජනක සෛල පරිත්‍යාගය සඳහා ඔබ සම්බන්ධ කර ගැනෙයි.

## රුධිර ජනක සෛල ප්‍රදානය කිරීම සිදු කරන්නේ කොහි දී ද?

මෙය විශේෂිත රෝහලකදී සිදු කරනු ලැබේ

## ඔබේ ශරීරයෙන් රුධිර ජනක සෛල ලබා ගන්නේ කෙ සේ ද?

මෙය ආකාර දෙකකට සිදු කෙරේ.

- මේ සඳහා අවශ්‍ය ඖෂධ එන්නත් කිරීමෙන් පසු ව පට්ටිකා ප්‍රදානය කිරීමට යොදා ගන්නා ආකාරයේ යන්ත්‍රයකට සම්බන්ධ කර රුධිර ජනක සෛල ලබා ගත හැකි ය.
- එ සේ නැතහොත් නිර්වින්දන තත්ත්ව යටතේ උකුල් ඇටයෙන් රතු ඇටමිදුළු ලබා ගැනීමෙන් ද රුධිර ජනක සෛල නිස්සාරණය කර ගත හැකි ය.





## රුධිර ජනක සෛල දායකයකු වීමට අවශ්‍ය සුදුසුකම්

- වයස අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතු ය.
- නිරෝගී සහ අවශ්‍ය සෞඛ්‍ය සුදුසුකම් සම්පූර් ණ විය යුතු ය.
- නිදන්ගත රෝග නොමැති විය යුතු ය.
- බර කිලෝ ග්‍රෑම් 50ට වඩා වැඩි විය යුතු ය.
- හිමොග්ලොබින් ප්‍රමාණය 12.5 g/dL ට වඩා වැඩි විය යුතු ය.
- අවදානම් ලිංගික හැසිරීම් වලින් තොර විය යුතු ය.

ඔබ මේ සඳහා උනන්දුවක් දක්වන්නේ නම් ලේ බැංකු කාර්ය මණ්ඩලයෙන් විමසන්න.

වැඩි විස්තර සඳහා:

**දුරකතනය**
+94 11 2 36 99 68

**වෙබ් අඩවිය**
nbts.health.gov.lk

**විද්‍යුත් තැපෑල**
slscdregistry@gmail.com

**නැතහොත් අප ගේ SLSCDR Facebook පිටුවෙන්**
https://www.facebook.com/scdrsrilanka

# ජීවිතයක් සුරකින්න!

## එන්න

**රුධිර ජනක සෛල දායකයකු ලෙස ලියාපදිංචි වන්න**



ජාතික රුධිර පාරවිලයන සේවය